# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

### නීතිවේදී උපාධි පරීක්ෂණය, සිව්වන වසර - 2022

### සමාගම් නීතිය

(පැය තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 06

ප්‍රශ්න <u>තුනකට **(03)** පමණක්</u> පිළිතුරු සපයන්න.

(අපහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. "වර්තමාන නූතන සමාජය තුළ, සමාගම්හි ක්‍රියාකාරකම් වල විෂය පථය සහ ඒවා සතු බලතල ප්‍රමාණය ඉතා පුළුල් වන අතර ඒවායේ ක්‍රියාවන්හි ප්‍රතිවිපාක මිනිස් සහ සමාජ ජීවිතයේ සෑම අංශයකටම බලපායි. මැඩපැවැත්වීමට නොහැකි වුවහොත්, හානි කිරීමට හා අපරාධ කිරීමට ඇති හැකියාව විනාශකාරී ප්‍රතිවිපාක වලට හේතු විය හැක. දැඩි නියාමනයට සහ වගවීමට යටත් ආයතන වලින් අතීතයේ සමාගම් නිදහස් වුවද, සංගමික සමාජ වගකීම සහ සංගමික අපරාධ වගකීම වැනි සංකල්ප මගින් සමාජයට අහිතකර වන අයුරින් සමාගම් සිය බලතල භාවිතා නොකරන බව සහතික කරයි."

ඉහත ප්‍රකාශයේ වලංගුතාව විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

2. ලහිරු, ළදරු ආහාර නිෂ්පාදනය කරන සමාගමක් වන Tiny Spoon Ltd (TSL) හි කොටස් හිමියන් පස් දෙනාගෙන් කෙනෙකි. TSL හි කොටස් වලින් 48% ක් ලහිරු සතු වන අතර අනෙකුත් කොටස් හිමියන් සිව්දෙනා වන විෂා, නිරාජ්, සස්නා සහ සන්දු, එක් අයෙක් 13% බැගින් කොටස් හිමිකර ගනී. මෙරට ළදරු සෞඛ්‍ය පිළිබඳ විශේෂඥයන් වන ලහිරු, විෂා සහ සන්දු යන පෝෂණවේදීන් තිදෙනා TSL හි අධ්‍යක්ෂකවරු වෙති. සන්දු

අධ්‍යක්ෂකවරයෙක් වුණත් අනිත් දෙදෙනා ඔහුව කළමනාකරණ තීරණ වලට සහභාගී කර නොගනී. වසර දහයකට වැඩි කාලයක්, TSL ශක්තිමත් පර්යේෂණ සහ සංවර්ධන කණ්ඩායමක් පවත්වාගෙන යයි. 2020 සිට, ලහිරු තමා ප්‍රධාන පර්යේෂකයා වන තරුණ පර්යේෂණ කණ්ඩායමක් සමඟ නව පර්යේෂණ ව්‍යාපෘති සාර්ථකව පවත්වාගෙන යයි. TSL පෙර වියදම් කළාට වඩා දෙගුණයක් වියදම් කරයි. විෂා ඇතැම් පර්යේෂණ ව්‍යාපෘති භාරව සිටින අතර කණ්ඩායමෙන් වෘත්තීය ගාස්තුවක් ද ලබයි. බාහිර පර්යේෂණ ලබා ගැනීමට අමතරව, ලහිරු සහ වීෂා TSL හි අභ්‍යන්තර පර්යේෂණ කණ්ඩායම විසින් සොයා ගන්නා ලද නව නිෂ්පාදන සඳහා පේටන්ට් බලපත්‍ර දෙකක් ලියාපදිංචි කර විවිධ බලපත්‍ර එකඟතාවන්ට එළඹේ. 2020 වසරේ සිට TSL හි මූල්‍ය සංචිත රුපියල් මිලියන 50කින් අඩු වී ඇති බව පවසමින් සන්දු විරුද්ධ වේ. ආහාර නිෂ්පාදන වල ගුණාත්මක භාවය පරීක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගැනීමට අසමත්ව ඇති බවත් අඩු ගුණාත්මක ළදරු ආහාර වෙළඳපොළ වෙත පැමිණීමට ඉඩ සැලසීම මගින් නුදුරු අනාගතයේ දී නිෂ්පාදනයේ කීර්ති නාමයට බරපතල හානි සිදු වනු ඇති බවටත් නිරාජ් දෝෂාරෝපණය කරයි. කනිෂ්ඨ වෛද්‍ය නිලධාරිනියක් වන සස්නා, ඇයගේ අනාගත අපේක්ෂාවන් හේතුවෙන් අදාල කාර්යයන් පිළිබඳව සෑහීමට පත් නොවූවද එහිලා පියවර ගැනීමෙන් වැළකී සිටී. පසුගිය වසර දෙක තුළ, TSL දුෂ්කරතා අත්විඳිමින් සිටී.

සමාගමේ සුළුතර කොටස් හිමියන් වන සන්දු සහ නිරාජ් ඔවුන්ට ගත හැකි යම් ක්‍රියාමාර්ග වේදැයි ඔබේ නීති උපදෙස් පතයි. අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු නීතිය ඇසුරෙන් ඔවුන් වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 100)

3 (a) එම කාලයේදී, සමාගම් ප්‍රවර්ධකයන් සහ ව්‍යාපාරිකයන් බලාතික්‍රමණ (ultra-vires) රීතිය අතිශයින් ජනප්‍රිය නොවූ සහ දුෂ්කර වූ ලෙස සැලකීය. කෙසේ වෙතත්, අධිකරණ සුපරීක්ෂාකාරීත්වය හේතුවෙන්, එය නොසැලෙන ජවයකින් සිය පාලනය පවත්වා ගෙන ගියේය.

බලාතික්‍රමණ සිද්ධාන්තය ආශ්‍රිත ශ්‍රී ලාංකික අධිකරණයේ ප්‍රවේශය ඇසුරින් ඔබ මෙම ප්‍රකාශය සමඟ කොතරම් දුරට එකඟ වන්නේද? අදාළ නඩු නීතිය සහ ව්‍යවස්ථාපිත විධිවිධාන ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න. ශ්‍රී ලංකාවේ වාණිජ ක්ෂේත්‍රය තුළ මෙම සිද්ධාන්තයේ අනාගතය සලකා බලන්න.

(ලකුණු 60)

3 (b) ඇඩම් සහ ස්මිත්, පුනර්ජනනීය බලශක්ති සමාගමක් වන Evergreen Energy (PLC) (සමාගම) හි අධ්‍යක්ෂවරුන් වෙති. පුනර්ජනනීය බලශක්තිය සඳහා වැඩිවන ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාවේ බලශක්ති වෙළඳපොලේ පවතින අනෙකුත් සූර්ය පැනල වලට සාපේක්ෂව තාක්‍ෂණිකව දියුණු නමුත් මිලෙන් අඩු සූර්ය පැනල ආනයනය කිරීමට සමාගම සැලසුම් කළේය. මෙම ව්‍යාපෘතියට මුදල් සැපයීම සඳහා, නිශ්චිත වර්ගයේ සූර්ය පැනල ආනයන බලපත්‍රය සඳහා වන ආශ්‍රිත තීන්දුව තවම නොලැබුනද එම පැනල ආනයනය කිරීමට සමාගමට බලය ඇති බව සඳහන් කරමින් ඇඩම් සහ ස්මිත් සංස්ථා ප්‍රකාශයක් නිකුත් කළහ. මෙම ව්‍යාපෘතියේ දැවැන්ත අනාගත වර්ධන විභවය මත විශ්වාසය තබා, මාර්ක් සමාගමෙහි සැලකිය යුතු කොටස් ප්‍රමාණයක් මිලදී ගන්නා ලදී. කෙසේ වෙතත්, සමාගමට අවශ්‍ය ආනයන බලපත්‍රය ලබා ගැනීමට නොහැකි වූ බැවින් ව්‍යාපෘතිය අත්හැර දමන ලදී.

ඇඩම් සහ ස්මිත්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට මාර්ක් අදහස් කරයි. ශ්‍රී ලංකා නීතිය යටතේ ඔහු සතු නීතිමය ප්‍රතිකර්ම පිළිබඳව මාර්ක් වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 40)

4. (a) ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සිද්ධාන්තය අනුමත කරන්නන් කියා සිටින්නේ එහි බලත්මකභාවය කොටස් ප්‍රාග්ධනය අධික ලෙස බෙදා හැරීමෙන් ණයහිමියන් ආරක්ෂා කොට ඔවුන්ගේ ආරක්ෂාව සහතික කරන බවයි. ඊට පටහැනිව, විරුද්ධ මතවාදීන් තර්ක කරන්නේ ගෙවීම් සහ කොටස් ප්‍රාග්ධනය බෙදාහැරීම සීමා කිරීම සමාගමක මූල්‍ය තීරණ ගැනීම විකෘති කරන අතර එය සමාගම ආර්ථික වශයෙන් ශක්‍ය ගනුදෙනු වල නිරත වීම වළක්වන බවයි.

මෙම පරස්පරතා විසඳීමට 2007 අංක 07 දරන සමාගම් පනත සමත් වී තිබේද? අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 40)

(b) General Motors Company (PLC) (සමාගම) සීලැන්ඩ්හි ප්‍රසිද්ධ මෝටර් රථ නිෂ්පාදකයෙකි. කෙසේ වෙතත්, වසංගතය අතරතුර සමාගමේ මූල්‍ය තත්ත්වය නරක අතට හැරුණු අතර රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් තත්ත්වය උග්‍ර විය. සමාගමේ ශුද්ධ වත්කම් එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකටත් වඩා අඩු වී ඇති බැවින්, මූල්‍ය අධ්‍යක්ෂවරයා වන සෙන් වහාම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවා සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා කළේය. කෙසේ වෙතත්, අලෙවිකරණ අධ්‍යක්ෂවරයා වන ජෝයි යෝජනා කළේ, නව ව්‍යාපාරික මාර්ග වලට පිවිසීමෙන්, විශේෂයෙන්ම විදුලි පාපැදි නිෂ්පාදනය සහ විකිණීමෙන්, සමාගමට යථා තත්ත්වයට පත් විය හැකි බවයි. සෙන් හැර, සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් නව ව්‍යාපාරය ආරම්භ කිරීමට එකඟ විය. කෙසේ වෙතත්, එක් මරණයක් ඇතුළුව බොහෝ තුවාල හා අනතුරු ඇති කළ නිෂ්පාදන දෝෂ නිසා, සමාගම විසින් නිෂ්පාදිත විදුලි පාපැදි සඳහා වූ ඉල්ලුම දුර්වල විය. එහි ප්‍රතිඵලයක් ලෙස, විදුලි පාපැදි නිෂ්පාදනයේදී නිසි ආරක්ෂිත ප්‍රමිතීන් අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් සීලැන්ඩ් පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් සමාගමට නඩු පවරා ඇත.

සීලැන්ඩ්හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන යැයි උපකල්පනය කරමින්, ඉහත සිද්ධියෙන් පැනනැගෙන නීතිමය කාරණා සාකච්ඡා කරමින් නෛතික මතයක් සකසන්න.

(ලකුණු 60)

5. අර්ජුන්, සුසිලා, කපිල, පූර්ණිමා, මධුෂි සහ නිසාලි 2017 වසරේ සංස්ථාපිත සමාගමක් වන ‘Fancy Fabrics Ltd.’ හි අධ්‍යක්ෂවරු වෙති. සමාගම සංස්ථාගත කිරීමට පෙර හොඳින් සැලසුම් කරන ලද ඔවුන්ගේ උපාය මාර්ගයට සාධාරණයක් ඉටු කරමින් ව්‍යාපාරය ඉක්මනින්ම සාර්ථක විය. 2019 දී ව්‍යාපාරය අඛණ්ඩව දියුණු වූ අතර, එම වසරේ ජූනි

මාසයේ දී කපිල ඇත්තෙන්ම නිදහස් නොකල බංකොලොත් කරුවෙකු බව හෙළි වූ විට අධ්‍යක්ෂ මණ්ඩලය අනපේක්ෂිත අභියෝගයකට මුහුණ දුන්නේය. මෙය ඔහුගේ සම අධ්‍යක්ෂකවරුන් නොදැන සිටි කරුණකි. මින් අනෙක් අධ්‍යක්ෂවරු කම්පනයට පත්වූ අතර ඉල්ලා අස්වන ලෙස කපිලට පැවසුහ. තම ඉල්ලා අස්වීමෙන් ඔහු සම්බන්ධ වූ සමාගම ගත් තීරණ අවලංගු වන බවට තර්ජනය කරමින් කපිල එය ප්‍රතික්ෂේප කරයි. අනෙක් අධ්‍යක්ෂවරුන් කනස්සල්ලට පත් වූ නමුත් ඔහුට දිගටම තනතුරේ සිටීමට අවසර දුන්නේය.

2020 දී වසංගතයේ ප්‍රතිවිපාක දැනීමට පටන් ගන්නා විට සමාගම අඛණ්ඩව දියුණු වෙමින් පැවතුණි. රජය විසින් සිදුකරන ලද අගුලු දැමීම් සහ සාප්පු සවාරි යාමේදී අන් පුද්ගලයින් සමඟ මිශ්‍ර වීමෙන් වෛරසයට නිරාවරණය වීමට ජනතාවගේ ඇති අකමැත්ත හේතුවෙන් සමාගම විකුණුම් වල විශාල අඩු වීමක් අත්විඳියි. සමාගම මෙම අභියෝග වලට මුහුණ දීමේ උත්සාහයක් ලෙස තම නිෂ්පාදන පාරිභෝගිකයින්ගේ නිවෙස් වෙත බෙදා හැරීම ආරම්භ කළ යුතු බව නිසාලි යෝජනා කරයි. අනෙක් අධ්‍යක්ෂවරු ඊට එකඟ වෙති. අර්ජුන්ගේ යෝජනාව සහ නිර්දේශය මත Fancy Fabrics විසින් මෑතකාලීන ආරම්භක සමාගමක් වන Pass It On Delivery Services Ltd සමඟ හවුල් වීමට තීරණය කරයි. අනෙක් අධ්‍යක්ෂවරු නොදැනුවත්ව, Pass It On Delivery Services හි ආරම්භක අධ්‍යක්ෂවරයා වූයේ අර්ජුන්ගේ පුත් රමේෂ් ය. Fancy Fabric විසින් මෙම බෙදා හැරීමේ සේවාව හරහා යවන සෑම එක් බෙදා හැරීමක් සඳහාම 2% ක කොමිස් මුදලක් අර්ජුන් වෙත ලැබේ.

අධ්‍යක්ෂවරියක් ලෙස සිය භූමිකාව කෙරෙහි ඇති පූර්ණිමා ගේ කැපවීම හීන වෙමින් පවතින බව අධ්‍යක්ෂක මණ්ඩලයේ අවධානයට ලක්වෙයි. පවතින අගුලු දැමීම් සහ කොවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් බොහෝ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් Zoom තාක්ෂණය මගින් පැවැත්වුවද, ඉන් බොහොමයකට සහභාගී වීමට පූර්ණිමා අපොහොසත් විය. සහභාගී වූ අවස්ථාවල, ඇය සාකච්ඡා සඳහා සක්‍රියව දායක නොවූ අතර සමාගමේ ක්‍රියාකාරකම් සහ ප්‍රශ්න පිළිබඳ අවබෝධයක් නොවූ බවක් පෙනෙන්නට තිබුණි.

කොවිඩ් මගින් ඇති වූ දුෂ්කරතා මඟහරවා ගැනීමට සමාගම අඛණ්ඩව සිය උපරිම උත්සාහයේ නිරත වුවද, ශ්‍රී ලංකා ආර්ථික අර්බුදය හේතුවෙන් ව්‍යාපාරවලට ඇති වූ අමතර දුෂ්කරතා නිසා, සමාගම සැබැවින්ම සිය පැවැත්ම සඳහා අරගල කරන බව පැහැදිලි විය.

ගෙවිය යුතු දිනට ණය ගෙවීම අපහසු වූ බැවින් සමාගම වසා දැමීම ගැන සලකා බැලිය යුතුද යන්න සාකච්ඡා කිරීමට 2022 මුල් භාගයේදී සුසිලා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවූවාය. කෙසේවෙතත්, අභියෝග මධ්‍යයේ වුවද සමාගමේ ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව කරගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේය. පසුව, සමාගම ගණන් බේරා වසා දැමීමට ලක් විය.

Fancy Fabrics Ltd හි අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් මතුව ඇති නීතිමය ගැටළු සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

6. රවී, නිලේෂ්, දිනේෂ් සහ සුනිල් පරිගණක උපාංග අලෙවි කරන ව්‍යාපාරයක් වන S&S Computers (SC) හි හවුල් කරුවෝ වේ. පහත කරුණු වලින් පැන නැගෙන නීතිමය ගැටළු සහ හවුල් කරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් සුදුසු අධිකාරීන් උපුටා දක්වමින් සාකච්ඡා කරන්න.

a) අනෙක් හවුල් කරුවන් දෙදෙනාට වඩා මුල් ප්‍රාග්ධනයන් වැඩි කොටස් හිමි රවී සහ නිලේෂ්, ව්‍යාපාරය කළමනාකරණය කිරීම සහ සියලු වැදගත් තීරණ ගැනීම සිදු කරයි. ඔව්හු සාමාන්‍යයෙන් වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වන අතර SC සඳහා වට්ටම් සහිත භාණ්ඩ මිලදී ගැනීමට විදේශගත වෙති. හවුල් ව්‍යාපාර ඔප්පුව මගින් ඔවුන් වෙනුවෙන් ගිවිසුම් ගත වන ඕනෑම තනි හවුල්කරුවෙකු සඳහා රුපියල් 1,000,000/- ක ණය සීමාවක් පනවා ඇත. රවී තම පෞද්ගලික විදේශ සංචාරයක් අතරතුර වෙළඳ ප්‍රදර්ශනයකදී ලැප්ටොප් පරිගණක සඳහා වඩාත් වාසිදායක වන ගනුදෙනුව සොයා ගත්තේය. එදින ප්‍රදර්ශනයේ අවසන් දිනය වූ බැවින් අනෙකුත් හවුල් කරුවන්ගේ අනුමැතියකින් තොරව ඔහු රු. 1,500,000/- ක වටිනාකමකට ලැප්ටොප් පරිගණක මිලදී ගත්තේය. නිලේෂ් සැලකිය යුතු USB Drives ප්‍රමාණයක් විදේශීය මිතුරෙකුගෙන් අඩු මුදලකට මිලදී ගත්තේය. ඔහු ඒවා වෙළඳපල මිලට SC වෙත විකුණුවේය.

(ලකුණු 40)

b) දිනේෂ්, D&A Electronics (D &A) වෙතින් හවුල් ව්‍යාපාරයේ නමින් රු. 700,000/- කට ඇතැම් පාවිච්චි කළ පරිගණක උපාංග ප්‍රමාණයක් අනෙකුත් හවුල් කරුවන්ගේ අනුදැනුමකින් තොරව මිලදී ගත්තේය. D&A හි තනි හිමිකරු වන්නේ දිනේෂ්ගේ සහෝදරයා වන කුසුම් බව අන් හවුල් කරුවන් දැන නොසිටියහ. D&A හි නිෂ්පාදන වල ගුණාත්මක භාවය සම්බන්ධයෙන් නරක නාමයක් පැවති අතර, ඉන් බොහොමයක් වගකීම් (warranties) නොමැතිව පාරිභෝගිකයින් වෙත අලෙවි කළේය. සිය ගනුදෙනුකරුවන් අතර SC හොඳ නමක් පවත්වා ගෙන ගිය අතර සිය විශිෂ්ට පාරිභෝගික සේවාව සඳහා සුවිශේෂී ස්ථානයක් ලබා ගත්තේය. මෙමගින් විකුණන ලද භාණ්ඩ බොහොමයක් සැලකිය යුතු වගකීම් කාලයක් සහිත නවතම භාණ්ඩ විය. අමතර උපාංග ලාභයක් සහිතව නැවත විකිණීමට SC ට නොහැකි වූ අතර කීර්ති නාමය අහිමි වීම ඇතුළුව මෙම විශේෂිත ගනුදෙනුවේදී සැලකිය යුතු පාඩුවක් අත්විඳින ලදී. මේ අතර දිනේෂ්ට ඉහත වෙළඳාමේ කොටසක් ඇති බව හවුල් කරුවන් අනාවරණය කරගත්හ.

(ලකුණු 40)

c) SC සිය ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා නගර සීමාව තුළ නව ශාඛාවක් විවෘත කිරීමට තීරණය කළේය. මේ සඳහා අලුතින් ඉදි කරන ලද සාප්පු සංකීර්ණයක කඩයක් බදු ගැනීම සඳහා සුනිල්, කුමාර්ව මුණ ගැසුණේය. හවුල් ව්‍යාපාරය උපයන ලාභයෙන් බදු මුදල මාසිකව ගෙවීමට SC එකඟ විය. සාර්ථක ව්‍යවසායකයකු වන කුමාර්, අවස්ථා කිහිපයකදී අලෙවිකරණය සහ එහි ව්‍යාපාරය දියුණු කිරීම පිළිබඳව SC වෙත උපදෙස් දුන්නේය. මෙම උපදෙස් මත SC ලාභ ලැබීය. එවැනි සේවාවන් ඉටු කරන සෑමවිටම SC කුමාර් වෙත උපදේශන ගාස්තු ගෙවීය. හවුල් කරුවකු ලෙස SC හා සම්බන්ධ වන ලෙස සුනිල් කිහිප වතාවක්ම කුමාර්ට ආරාධනා කළ අතර, සමහර අවස්ථාවලදී, සුනිල්ගේ ආරාධනයෙන් කුමාර් හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාරික කටයුතු සඳහා එය නියෝජනය කළේය. කුමාර් දැන් කියා සිටින්නේ තමන් SC හි හවුල් කරුවකු වන බවයි.

(ලකුණු 20)

***